# මවගේ විදේශ සේවා නියුක්තිය තුළින් දරුවාගේ අධ්‍යාපනයට සිදුවන බලපෑම පිළිබඳ විමසුමක්.

(මධ්‍යම පළාතේ නුවර දිස්ත්‍රික්කයේ ගලගෙදර ප්‍රදේශය ඇසුරින් )

එච්.ජී. කෝලිත නිශ්ශංක බණ්ඩාර, එච්. කේ. උදයාංග,
ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය
අලෙවි කළමණාකරණ අධ්‍යයන අංශය, කැලණිය විශ්ව විද්‍යාලය, කැලණිය.

## ABSTRACT

ශ්‍රී ලංකාවේ 1977 ට පසුව විදේශ සංක්‍රමණ වල ද වැඩිවීමක් සිදුවිය. මෑතකදී මෙයින් ප්‍රබල ස්ථානයක පසු වන්නේ ස්ත්‍රී පාර්ශවයයි. විදේශ රැකියා සඳහා පිටරට යෑම වර්තමානයේ දී සීඝ්‍රයෙන් වැඩි වී ඇති අතර එය ශ්‍රී ලංකා ආර්ථිකය තුළ විදේශ විනිමය ලබාදෙන ප්‍රබලතම මාධ්‍යයක් බවට ද වර්තමානයේදී පත්වී තිබේ. 2009 වන විට විදේශ සංක්‍රාම ලැබීම ඇමරිකානු ඩොලර් මිලියන 3330 කි. 2007 දී ස්ත්‍රීන්ගේ විදේශගතවූ ප්‍රමාණය 114977 ( 52.6%) වූ අතර එය 2009 වන විට 127843 (51.7%) ක් විය.

අධ්‍යයනයේ අරමුණ වූයේ මව විදේශගත වීම දරුවාගේ අධ්‍යාපන තත්ත්වය සඳහා බලපාන්නේ ද එසේ නම් කොතරම් දුරකට දරුවාගේ අධ්‍යාපනයට බලපෑම් ඇති කරයි ද යන්න සොයා බැලීමයි.

මෙම අධ්‍යයනය සිදු කිරීම සඳහා තෝරා ගන්නා ලද අධ්‍යයන ප්‍රදේශය වූයේ මහනුවර දිස්ත්‍රික්කයේ ගලගෙදර ප්‍රදේශිය ලේකම් කොට්ඨාශයයි. එම ප්‍රදේශය තුලින් තොරා ගන්නා ලද **මහ ගලබාව** පාසලෙන් මව විදේශගත වූ දරුවන් **50** ක සහ මව්වරු විදේශගත නොවුන දරුවන් එනම් (දරුවා මව සමග ජීවත්වන) **50** ක නියැදියක් සරල සසම්භාවීව තෝරා ගන්නා ලදි. ද්විතීක දත්ත වශයෙන් ශ්‍රී ලංකා මහබැංකු වාර්තාව, පුවත්පත්, ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යංශයේ සංඛ්‍යා නිබන්දයන්" මේ සම්භන්ධයෙන් පලවී අති පොත්පත්, සඟරා, ආදිය භාවිතා කළ අතර යෝග්‍ය පරිදි විස්තරාත්මක සංඛ්‍යානමය විශ්ලේෂණ ක්‍රම උපයෝගී කරගනිමින් විශ්ලේෂණය කරණ ලදි.

අධ්‍යයනය තුළින් හෙළි වූ කරුණු වශයෙන් මව විදේශ ගතවූ දරුවන් අතරමගදී පාසල් අතහැර යාම, එම සිසුන්ගේ සාධන මට්ටම් අඩුවීම හා සිසුන් පාසලේ බාහිර වැඩවල නිරතවීම අඩුබව, පෞරුෂය දුර්වල වීම හා නායකත්වයට ඇති බිය, ගැහැණු දරුවන්ට මවගේ වැඩ කිරීමට සිදු වීම නිසා අධ්‍යාපනය සඳහා ඇති කාලය අඩුවීම ආදිය දැක්විය හැකිය.

මේ අනුව අධ්‍යයනය තුළින් නිගමනය කලහැකි වන්නේ මව විදේශගත වීම දරුවාගේ අධ්‍යාපන මට්ටම අඩාල කිරීම සඳහා බලපාන බවයි.

මූලපද. සිසුන්ගේ සාධන මට්ටම්, විදේශ සේවා නියුක්තිය, විදේශ විනිමය, පෞරුෂය දුර්වලවීම.